# ධර්මදූත විද්‍යාලය - බදුල්ල
## ප්‍රථම වාර පරීක්ෂණය - 2017
# බුද්ධ ධර්මය.

9 ශ්‍රේණිය                                                  කාලය -: පැය 02යි.

### 1 කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(1) අප සිත් තුළ මුල් බැස පවත්නා ඇල්ම ,ආසාව,ගිජුකම හඳුන්වන්නේ..................... නමිනි.
1. ද්වේෂය
11. මෝහය
111. රාගය
1V. අලෝභය

(2) මෝහ චේතනාව යනු,
1. අප සිත් තුළ මුල් බැසගත් ආසාවයි.
11. අප තුළ ඇති විරුද්ධවාදී බවයි.
111. අප තුළ ඇති පරිත්‍යාග සිතුවිල්ලයි.
1V. අප තුළ ඇති රැවටීම මූලාවයි.

(3) අප සිතාමතා කරන ක්‍රියා හඳුන්වන්නේ..................................නමිනි.
1. කුසල්
11. අකුසල්
111.කර්ම
1V. පින්

(4) සසර දුකින් අතමිදී නිවන් දක්නාතෙක්ම විපාක ලබා දීමට හැකියාව ඇති කර්මය,
1. දිට්ඨධම්මවේදනීය කර්මයයි.
11.උපපජ්ජවේදනීය කර්මයයි.
111. අපරාපරියවේදනීය කර්මයයි.
1V. අහෝසි කර්මයයි.

(5) නිතර නිතර පුරුද්දක් මෙන් කරන ලද කුසලාකුසලයෝ හඳුන්වන්නේ.................. නමිනි.
1. ගරුක කර්ම
11.අචිණ්ණ කර්ම
111. ආසන්න කර්ම
1V. කටත්තා කර්ම

(6) " උපස්ථම්භක කර්මය" යනුවෙන් හඳුන්වන්නේ,
1. ප්‍රතිසන්ධිය ලබා දීමට බලපාන කර්මයයි.
11. ජනක කර්මයට අනුබල දෙන කර්මයයි.
111.ජනක කර්මයට බාධා පමුණුවන කර්මයයි.
1V. ජනක කර්මයාගේ විපාකදීම නතර කොට තමාම විපාක දෙන කර්මයයි.

(7) " නිබ්බාන පරමං සුඛං " යන්නෙහි අර්ථය වන්නේ,
1. නිවන හොඳම ගමනයි.
11. නිවන සැනසීම ගෙනදේ යන්නයි.
111.නිවන යනු තෘෂ්ණාව නැති කිරීමයි.
1V. නිවන පරම සැපයයි.

( 8 ) " තෘෂ්ණාව නැති කිරීම "

1. නිවනයි. 11.සැපයයි. 111.ගුණයයි. 1V. හේතුඵල දහමයි.

( 9 ) "යථා අඤ්ඤතරං බීජං" යන ගාථාව ඇතුළත්වන සූත්‍රය වන්නේ,

1. රතන සූත්‍රයයි. 11. සේලා සූත්‍රයයි.
111. මංගල සූත්‍රයයි. 1V. ගිරිමානන්ද සූත්‍රයයි.

( 10 ) " පටිච්ච සමුප්පාදය " යන්නෙහි අර්ථය කුමක්ද?

1. අටලෝ දහම යන්නයි. 11. චතුසත්‍යය යන්නයි.
111. සම්මා වාචා යන්නයි. 1V. හේතුඵල දහම යන්නයි.

( 11 ) "යේධම්මා හේතුප්පභාවා.................." යන ගාථාවෙහි දෙපදයක් අසා සෝවාන් වූයේ.....................................පිරිවැජියායි.

1. උපතිස්ස 11. කෝලිත 111. සුභ 1V. යස

( 12 ) බුදුන්වහන්සේ පටිච්ච සමුප්පාදය අනුලෝමපටිලෝම වශයෙන් මෙනෙහි කරන ලදදේ කුමන සතියේද?

1. දෙවන සතියේදීය. 11. හතරවන සතියේදීය.
111. පළමු සතියේදීය. 1V. තුන්වන සතියේදීය.

( 13 ) " ආපදාසු භවිස්සති " යන්නේහි අර්ථය වන්නේ,

1. ආපදාවන්හි වීර්යෙන් ක්‍රියා කිරීම යන්නයි.
11. ආපදාවන්හිදී ප්‍රයෝජන පිණිස පවතී යන්නයි.
111. ආපදාව කාටත් පොදුය.
1V. ආපදාවන්ට මුහුණදිය යුතුය.

( 14 ) ආපදාවට නිවරදිව මුහුණදුන් බවට නිදසුනක් සපයන ජාතක කතාවක් වන්නේ,

1. සේරිවානිජ ජාතක කතාවයි. 11. අපණ්ණක ජාතක කතාවයි.
111. මස මානවක ජාතකයයි. 1V. වෙස්සන්තර ජාතකයයි.

( 15 ) බුදුන්වහන්සේගේ අන්තිම ශ්‍රාවකයා වන්නේ.......................................හිමිය.

1. ආනන්ද 11. භගු 111. කිම්බිල 1V. සුභද්‍ර

( ලකුණු-2x15)

11 කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) 1. නිර්වාණයෙහි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
11. බුදුන් වහන්සේගේ අවසාන බුද්ධ වචනය ලියා දක්වන්න.
111. එහි අර්ථය ලියා දක්වන්න.
1V. බුදුන් වහන්සේ අවසන් වරට ශරීරය ධෝවනය කරගත් නදීය කුමක්ද?
V. බුදුන් වහන්සේට අවසන් දානය පිළිගැන්වූයේ කවුද?
V1. සතර මහෝපදේශ දේශනා කළේ කුමන නගරයේදීද?
V11. බුදුන් වහන්සේ පිරිනිවන්පාන ලද්දේ කුමන ස්ථානයේදීද?
V111. අවසන් බුද්ධ වචනය අඩංගු සූත්‍ර දේශනාව කුමක්ද?
1X. අපට විපත් පමුණුවන දේවල් දෙකක් නම් කරන්න.
X. කාන්තාරයේ ගලක් කඩා ජලය ලබා ලත් බව දැක්වෙන ජාතක කතාව කුමක්ද?
X1. “ යේ ධම්මා හේතුප්පභවා” යන ගාථාව සම්පූර්ණ කරන්න.
X11. එහි අර්ථය ලියා දක්වන්න.
X111. උපපජ්ජවේදනීය කර්මය හඳුන්වන්න.
1X. විපාක දෙන කාර්යය අනුව කොටස් සතරකි. ඉන් දෙකක් නම් කරන්න.
XV. බෞද්ධයෙකු විසින් දැක සංවේග උපදවාගතයුතු ස්ථාන හතර නම් කරන්න.

( ලකුණු-15 x 4 )

(02) 1. ආපදාවක් යනු කුමක්ද? (ලකුණු 02කි.)
11. අප ආපදාවයකට ලක්වන අවස්ථා 03ක් නම් කරන්න. (ලකුණු 03කි.)
111. අප අපදා කළමණාකරණය කර ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.
(ලකුණු 05කි.)